# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,483 — 1965 අගෝස්තු 16 වැනි සඳුද — 1965.8.16

No. 14,483 — MONDAY, AUGUST 16, 1965

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1965 අංක 306**

අ.ආ.කා. අංකය ජේ. 32(2)

අ.ආ.කා. අංකය ජේ. 83/47(3)

ගරු මිලියානි ක්ලෝඩ් සන්සෝනි අග්‍ර විනිශ්චයකාරතුමා දිවයිනෙන් බැහැරව නිවාඩු සිටින කාලය තුළ, 1965 අගෝස්තු 22 වැනි දින සිට දිවයිනේ අග්‍ර විනිශ්චයකාර ධූරයෙහි වැඩ බැලීම පිණිස අග්‍රාණ්ඩුකාරතුමන් විසින් (6 වැනි අධිකාරය වන) උසාවි ආඥා පනතේ 8 සහ 9 වැනි වගන්ති සමග කියවෙන, 1946 යේ හා 1947 තේ, ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 52 වැනි වගන්තිය යටතේ, ඕ.බී.ඊ. නාමධාරී, ගරු හිව් නෝමන් ග්‍රෙගරි ප්‍රනාන්දු කණිෂ්ඨ විනිශ්චයකාර තුමා පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

තවද, එකී ගරු මිලියානි ක්ලෝඩ් සන්සෝනි අග්‍ර විනිශ්චයකාරතුමා දිවයිනෙන් බැහැර නිවාඩු සිටින කාලය තුළ, 1965 අගෝස්තු 22 වැනි දින සිට අධිකරණ සේවා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු ලෙස අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, ඉහතකී 1946 යේ හා 1947 තේ, ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 53 වැනි වගන්තිය යටතේ, ගරු ලෙනාඩ් බර්නිස් ද සිල්වා කණිෂ්ඨ විනිශ්චයකාරතුමා පත් කළ බවද මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 අගෝස්තු 14 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

8–654

---

**1965 අංක 307**

අ.ආ.කා. අංකය සී. 162/49 (5)

අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ, ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ඇම්. රාජේන්ද්‍ර මහතා, තම රාජකාරිවලට අමතරව, 1965 අගෝස්තු 14 වැනි දින සිට, නැවත නියෝග කරන තුරු, ප්‍රවාහණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 අගෝස්තු 16 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

8–655

1225—ආර් 8066—6,325 (65/8)

# ආණ්ඩුවේ නිවේදන

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥව

### 1965 ඡන්දදයක නාමලේඛන සංශෝධනය කිරීම

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥවේ 18(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස් තැන්පත්, එඩ්වින් ෆිලික්ස් ඩයස් අබේසිංහ වන මම, 1965 ඡන්දදයක නාම ලේඛන සංශෝධනය සඳහා ඉහත සඳහන් වගන්තියෙන් සකස් කිරීම අවශ්‍ය වී තිබෙන ලැයිස්තු, සියළුම මැතිවරණ කොට්ඨාශවල ලියා පදිංචි කිරීමේ නිලධාරීන් විසින් සම්පූර්ණ කළ යුතු අවසාන දිනය, 1965 දෙසැම්බර් 30 වැනි දින බවට, මෙම දැන්වීමෙන් නියම කරමි.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්.

1965 අගෝස්තු 14 වැනි දින,
කොළඹ දී ය.

8–632

---

ඉ. වා. හා වි/අමා. අංක ජේ. 258(බීආර්) අ. ආ. කා. අංක ඇල්. 91

1964රේ අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතේ 6(සී) වැනි වගන්තියෙන් සංශොධිත, (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19(3) වැනි වගන්තියේ විධිවිධාන යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමන්ගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, ටී. සී. පී. ගුණතිලක මහතා 1965 අගෝස්තු 15 වැනි දින සිට සමාලොචන මණ්ඩලයේ උප සභාපති වශයෙන් පත් කරන ලද බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

අග්‍රාණ්ඩුකාරතුමාගේ කායඝාලය,
කොළඹ, 1965 අගෝස්තු 14.

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

8–631/1

---

ඉ. වා. හා වි/අමා. අංක ජේ. 258(බීආර්) අ. ආ. කා. අංක ඇල්. 91

1964රේ අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතේ 6(ඒ) හා 6(බී) වැනි වගන්තිවලින් සංශෝධිත (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19 වැනි වගන්තියේ (1) හා (2) වැනි උප වගන්තිවල විධිවිධාන යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමන්ගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, ඩී. එල්. එදුස්සූරිය මහතා, වී. එෆ්. ගුණරත්න මහතා හා එම්. එල්. ද සිල්වා මහතා 1965 අගෝස්තු 15 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා, එහි සඳහන් වන පරිදි ඇපැල් නඩු විභාගය පිණිස වූ සමාලොචන මණ්ඩලයේ නීතිඥ සාමාජිකයින් වශයෙන් පත් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

අග්‍රාණ්ඩුකාරතුමාගේ කායඝාලය,
කොළඹ, 1965 අගෝස්තු 14.

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

8–631/2.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි